

# ද්විත්ව පුරවැසි මන්ත්‍රීන් තව ඇද්දැයි සොයයි

■ ලසන්ත වීරකුලසූරිය

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා අතර තවත් ද්විත්ව පුරවැසිභාවය තිබෙන මන්ත්‍රීවරුන් සිටින්නේදැයි සොයාදෙන ලෙස ඉල්ලා පැෆරල් සංවිධානය ආගමන විගමන පාලකවරයාගෙන් ලිඛිතව ඉල්ලා සිටීමට 03 පිටුව



## ද්විත්ව පුරවැසි මන්ත්‍රීන්....

තීරණය කර ඇත. ලබන සඳුදා මෙම ඉල්ලීම ආගමන විගමන පාලකවරයා වෙත යොමුකරන බව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ නීතිඥ රෝහණ හෙට්ටිආරච්චි ප්‍රකාශ කළේය.

රටේ නීති සම්පාදනය කරන ස්ථානය වන පාර්ලිමේන්තුව තුළ ද්විත්ව පුරවැසියන් සිටීම රටේ අනාගතයට ගැටලුවක් බවද පෙන්වා දුන් ඔහු ද්විත්ව පුරවැසියන්ට මන්ත්‍රීධුර දැරිය නොහැකිය යන නීතිය අමාත්‍යාංශ ලේකම්වරුන්ටත් ඇමිය යුතු බවද කීවේය.

අගමන විගමන පාලකවරයා දෙන තීන්දුව අනුව තවත් ද්විත්ව පුරවැසියන් පාර්ලිමේන්තුව තුළ සිටින්නේද නැද්ද යන්න නිවැරදිවම සොයාගත හැකි බවද ඒ මහතා සඳහන් කළේය.